# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1891/43 - 2014 දෙසැම්බර් මස 05 වැනි සිකුරාදා - 2014.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. - 11/2009.

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

27 අ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරන පනතේ 27 අ වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මේ නියමය මගින් -

(අ) ඉහත සඳහන් පනතේ 27 අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද, 1982 මාර්තු මස 12 වන දින අංක 183/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය පරිදි, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත මගින් පිහිටුවන ලද ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතුකර ඇත්තා වූ මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන හන්තාන වත්ත නැමැති ඉඩම සම්බන්ධයෙන් වූ නියමය, එකී හන්තාන වත්ත නැමති ඉඩමේ කොටසක් වන්නාවූ මෙහි දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන්නාවූ බිම් ප්‍රමාණයට අදාළ වන්නාවූ කොටස, එකී මණ්ඩලය වෙත සතුකිරීම සඳහා වූ ප්‍රතිඥාවට අදාළ නියමයන් සහ කොන්දේසිවලට අනුව ක්‍රියාකර නොමැතිවීම හේතුවෙන්, ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින්, එකී නියමය මෙයින් සංශෝධනය කරමි.

(ආ) මෙම ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් පසුව, මෙහි දෙවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති එකී ඉඩමේ බිම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත සතුකර දෙන බවට මෙයින් ප්‍රකාශ කරමි.

**පළමුවන උපලේඛනය**

***ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ඇති හන්තාන වත්ත නම් ඉඩමේ විස්තර***

| *ගැසට් නිවේදනය පිළිබඳ විස්තර* | *ඉඩමේ නම* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරන ලද ඉඩම් ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1982.03.12 දින අංක 183/10 | හන්තානවත්ත | මහනුවර | තලාතුඔය | හෙක්ටයාර් 414.63 |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## දෙවන උපලේඛනය

### කොමිසම වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තර

| වෙන් කර දී ඇති විශේෂ අංකය | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පළමුවෙනි උපලේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩමෙන් කොමිසම වෙත නැවත පැවරෙන ඉඩම් කොටස |
|---|---|---|---|---|
| කො/765 | හන්තානවත්ත | මහනුවර | තලාතුඔය | මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ තලාතුඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුවෙල ගමේ හන්තාන වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු රංජිත් වීරසිංහ මහතා විසින් 2012.04.05 දින මැන සකස්කර ඇති අංක 1069/2012 දරන පිඹුරේ කැබලි අංක 01 න් පෙන්නුම් කර ඇති,<br><br>උතුරට :- හන්තාන වත්ත ;<br>නැගෙනහිරට :- හන්තාන වත්ත ;<br>දකුණට :- මහනුවර හා ගලහ ප්‍රධාන මාර්ගය ;<br>බස්නාහිරට :- පාර යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් දශම බින්දුවයි පහයි බින්දුවයි හයක් (හෙක් : 0.0506) වන බිම් ප්‍රමාණය. |

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 දෙසැම්බර් මස 04 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

12 - 728

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.